// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1979/33 - 2016 අගෝස්තු මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2016.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2 වන සංශෝධනය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාව

2013 දෙසැම්බර් මස 23 දිනැති හා අංක 1842/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ 2015 ජූලි 16 දිනැති හා අංක 1923/47 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය විය යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**දෙවන (11) උපලේඛනය**

***අන්තර් කාලීන විධිවිධාන***

1. පොදු කොන්දේසි :

1.1 අන්තර් කාලය

අන්තර් කාලය 2017 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වේ.

2. උසස් කිරීමේ ක්‍රමවේදය :

2.1 සේවයේ දෙවන (11) ශ්‍රේණියට උසස් කිරීම :

2.1.1 : 2008 ජනවාරි මස 01 දිනට පෙර සේවයේ තුන්වන (111) පන්තියට බඳවාගත් නිලධාරීන් දෙවන (11) ශ්‍රේණියට උසස් කිරීම

2.1.1 (අ) උපඡෙදයේ සඳහන් විධිවිධාන යටතේ සිදු කරනු ලැබේ.

2.1.2 2008 ජනවාරි මස 01 දින සිට මෙම ව්‍යවස්ථාව බලාත්මක වන දින තෙක් සේවයේ තුන්වන (111) පන්තියට බඳවාගත් නිලධාරීන් සේවයේ දෙවන (11) ශ්‍රේණියට උසස් කිරීම, 2.1.2 (අ) උපඡෙදයෙහි සඳහන් විධිවිධාන යටතේ සිදු කරනු ලැබේ.

08 - 744

1A - G 24013 — 09 (2016/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*